# සෙබළිය

● 01 වන කලාපය ● 2024 අප්‍රේල් - ජුනි

## 25 වන බලකාධිපතිතුමාගේ සම්ප්‍රාප්තිය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ප්‍රකාශනයකි

# සෙබළිය



## මගපෙන්වීම

මේජර් ජෙනරාල්
එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී
බලකාධිපති
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය



## අධීක්ෂණය

මේජර් ජෙනරාල්
ජේකේආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී යූඑස්පී
මධ්‍යස්ථාන සේනාවිධායක
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය



### උපදේශකත්වය

කර්නල්
බීඒටීඑස්කේ බස්නායක ආර්එස්පී යූඑස්පී අයිජී
නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය



## ප්‍රධාන සංස්කාරක

මේජර්
ඊඑම්එච්සී ද සේරම් පීඑස්සී ශ්‍රීලයුකාබ
අණදෙන නිලධාරිණී
1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය



## සහය සංස්කාරක

කපිතාන් සීටී ජෝශප් ශ්‍රීලයුකාබ
තොරතුරු තාක්ෂණ නිලධාරිණී
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය



## පරිගනක අකුරු සංයෝජනය/කවර නිර්මාණය හා පිටු සැකසීම

කපිතාන් ඩීපී එදිරිවීර ශ්‍රීලයුකාබ
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

---

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**
"සෙබළිය"
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය,
නො. 30, කින්සි පාර,
බොරැල්ල.

**ඊමේල්**
rhqslawc@army.lk
rhqslawc12@gmail.com

**දුරකථන**
011 2686498

**යුහ දිගුව**
68327

**"සෙබළිය" අන්තර්ජාලය ඔස්සේ කියවීමට පිවිසෙන්න**
https://alt.army.lk/slawc/si

**ප්‍රකාශනය**
ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

# 25 වන

## බලකාධිපති ලෙස රාජකාරී අරඹමින්











"ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ 25 වන බලකාධිපති ලෙස යුද්ධ හමුදාව තුළ අත්දැකීම් බහුල, දක්ෂ නිලධාරියකු වන මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් යුද්ධ හමුදා චාරිත්‍රානුකූලව හා ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් 2024 අප්‍රේල් මස 22 වන දිනට යෙදුණු සුබ මොහොතින් සිය රාජකාරි අරඹන ලදී"



# බලකාධිපතිතුමාගේ පණිවිඩය



56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති
**මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී විසින්**
නිකුත් කරනු ලබන පණිවුඩය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය ආරම්භ වී මේ වනවිට වසර 44 ක් ගෙවී යමින් පවතින අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ 25 වන බලකාධිපති ලෙස ඔබ සැම වෙනුවෙන් "සෙබළිය" සඟරාව වෙත පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් ලෙස සලකන අතර, ඔබේ දක්ෂතාවයන්, නිපුණතාවයන් මෙන්ම බලකායක් ලෙස ඔබ ලද ජයග්‍රහණයන්ගෙන් සුසංයෝජනය වී නිර්මාණය කෙරෙන මෙම "සෙබළිය" සඟරාව නැවතත් එළිදැක්වීමට අවකාශය උදාවීම පිළිබඳව මේ මොහොතේ මාගේ හදපිරි සතුට සහ සුභාශිංසන පිරිනමමි.

වර්ෂ 1979 සැප්තැම්බර් මස පළමුවන දින දී පළමු කාන්තා බලකාය ආරම්භ වීමෙන් පසුව වර්ෂ 1997 නොවැම්බර් මස 17 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානය නගා සිටුවන ලද අතර, වර්තමානය වනවිට නිත්‍ය ඒකක 02 ක්, ස්වෙච්ඡා ඒකක 02 ක් සහ පුහුණු පාසලක් සහිතව 186 ක නිලධාරිනියන් පිරිසක් හා 2797 ක සෙසුනිලයින් පිරිසකගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී ඇතුළු අනෙකුත් විවිධ රාජකරීන් ආදී වශයෙන් සිය මෙහෙවර ඉටුකරමින් යුද්ධ හමුදාව තුළ වෘත්තීමය ශක්‍යතාව සහිත බලකායක් ලෙසින් කටයුතු කරයි. කාන්තාවක් ලෙස විවිධ අභියෝග දුෂ්කරතා මධ්‍යයේ වුවත් ඒවාට සාර්ථකව මුහුණ දෙමින් අධිෂ්ඨානශීලී ගමනක් යන කාන්තා බලකාය, කාලීන අවශ්‍යතා මැනවින් හඳුනාගනිමින් දේශය වෙනුවෙන් තවදුරටත් අඛණ්ඩ මෙහෙවරක නියැලී සිටී.

සැබැවින්ම වරෙක රණබිමද, වරෙක කෙළිබිමද එකසේ ජයගත් කාන්තා බලකායේ විහාරමහා දේවියන් මාතෘ භූමියේ ආරක්ෂාව වෙනුවෙන් සිය දායකත්වය ලබාදී, තවත් වරෙක සාමාජීය අවශ්‍යතාවයන් සඳහා වූ මෙහෙවර ඇතුළු දේශය ගොඩනැගීම පිණිස වූ සංවර්ධන කාර්යයන්ට ලබාදෙන්නා වූ අසමසම දායකත්වයද ප්‍රශංසනීය වේ. සාඩම්බර ඉතිහාසයක් ඇති කාන්තා බලකායේ මෙම "සෙබළිය" සඟරාව නැවත විද්‍යුත් පිටපතක් ලෙස ඔබ අතට පත්වීම මහත් අභිමානයක් වන අතර, එය කාන්තා බලකා ඉතිහාසයත් වර්තමානයත් අනාගතයත් නැවත එකිනෙක යා කිරීමට ඉඩහසර වෙන්වන ලද්දක් යැයි සඳහන් කළ හැක.

මේ දක්වා කාන්තා බලකායේ උන්නතිය උදෙසා විශාල මෙහෙවරක් කළ හිටපු බලකාධිපතිවරු සේනාවිධායකවරු ඇතුළු සියලු සාමාජිකයන් හට මෙම මොහොතේ මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පළකර සිටින අතර, යුද්ධ හමුදාවට සවියක් වෙමින් හා දේශයට ගෞරවයක් අත්කරදෙමින් අභීත විරු දියණියක් ලෙස ඉදිරියටත් කටයුතු කරන්නට සියලු ශක්තිය, ධෛර්යය ඔබ සියලුදෙනාට ලැබේවායි මා ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

2024 ජුලි මස 21 වන දින

එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී
මේජර් ජෙනරාල්
බලකාධිපති - ශ්‍රීලයුකාබ

# මධ්‍යස්ථාන සේනාවිධායකතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක
**මේජර් ජෙනරාල් ජේ කේ ආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී යූඑස්පී**
විසින් නිකුත් කරනු ලබන පණිවිඩය

විහාරමහා දේවියගේ පරපුරෙන් පැවත එන අභීත විරු දියණියන්ගෙන් සැඳුම්ලත් "සවිබල සිත් අවි බල දෙත් " යන උදාර තේමා පාඨය රැගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය යනු පරාර්ථයටම කැපවූ අභිමානවත්, දක්ෂ, සුවිශේෂී මෙහෙවරක් සිදුකරන බලකායක් වේ. වීරත්වය හිමි ඔවුන් තුළ සැඟව තිබෙන නිර්මාණාත්මක හැකියාවන් මෙන්ම කෙළිබිම ඇතුළු සෑම අංශයකින්ම ලද ජයග්‍රහණ හා කාන්තා බලකායේ එදාමෙදාතුර කාලීන තොරතුරු සමගින් නැවතත් එළිදැක්වෙන සෙබළිය සඟරාව කාන්තා බලකා ඉතිහාසයේ තවත් නැවුම් වූ සංධිස්ථානයක් ලෙස සනිටුහන්වනු ඇත.

අද වනවිට සමස්ත ලෝකයම විවිධ අර්බුදකාරී තත්වයන්ට මුහුණදෙමින් සිටින අතර, රටක් ලෙස අපටද ඒවායෙහි සෘණාත්මක බලපෑම් එල්ලවන අතර ආර්ථිකමය, සාමාජීමය හෝ සෞඛ්‍යමය වශයෙන් කවර අභියෝගයක් අප හමුවේ නිර්මාණය වූවත් තම රාජකාරීය නිසි ලෙස ඉටුකරමින් කාන්තා බළකා නාමය යුද්ධ හමුදාව තුළත්, අප රට තුළත්, ලෝකය හමුවේත් ඔසවා තබන්නට තරම් දක්ෂ නිලධාරිනියන් හා සෙබළියන් රැසකගෙන් මෙම බලකාය සමන්විත වේ. තවද, මෙම බලකාය ඕනෑම අවස්ථාවකට උචිත ලෙස ක්‍රියාකිරීමටත් ඕනෑම විටකදී කාන්තාවක්වීමේ ගෞරවයක් සහ දැඩි විනයක් ඉතා උසස් ලෙස පවත්වා ගනිමින් සුදුසු නායකත්වය ගෙන කටයුතු කරන්නට තරම් ශක්තිමත් සුවිශේෂ පවුරක් ලෙස වර්තමානය වනවිට රටේ ජනයාගේද ගෞරවාදරයට පාත්‍ර වූ බලකායක් වීම සුවිශේෂී කරුණකි.

කාන්තා බලකාය ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ද රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ද තවත් විටක මවක, බිරිඳක, සහෝදරියක, දියණියක ලෙසද සිය කුටුම්බය තුළ යුතුකම් හා වගකීම් මනා ලෙස ඉටුකරමින් මාතෘභූමියේ සංවර්ධනාත්මක ඉලක්ක සාක්ෂාත් කිරීම උදෙසාද සිය උපරිම දායකත්වය සපයමින් සිටි.

වසර කිහිපයකට පසු නැවත විද්‍යුත් පිටපතක් ලෙස එළිදකින මෙම "සෙබළිය" සඟරාව තුළින් කාත්තා බලකායේ වර්ථමාන සාර්ථකත්වය හා සියලු නිලයන්ගේ නිර්මාණාත්මක හැකියාවන් තවදුරටත් ලෝකය හමුවේ ගෙනහැර පාන්නට මංපෙත් විවර කරනු ලබයි. ඒ තුළින් විනයගරුක මෙන්ම දක්ෂ බලකායක් ලෙස යුද්ධ හමුදාව තුළ සිය බලකා ධජය ඉහල නංවන්නටත් යුද්ධ හමුදාවේ හෙට දවස උදෙසා සවියක් වෙමින් හා දේශයට තවදුරටත් ගෞරවයක් අත්කරදෙමින් මෙම කර්තව්‍ය ඉදිරියටත් සිදුකරගෙන යන්නට ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

2024 ජුලි මස 21 වන දින

ජේ කේ ආර් ජයකොඩි ආර්ඩබ්ලිව්පී යූඑස්පී
මේජර් ජෙනරාල්
මධ්‍යස්ථාන සේනාවිධායක - ශ්‍රීලයුකාබ

# රෙජිමේන්තු ගීතය

සාගර ජල කඳ හද බැඳ රකිනා
සාදර සිතිවිලි දිරි දී වඩනා
මිහිකත මැණිකක් සේ ලොව දිලෙනා
මාගේ මව්බිම සුරකිනු නිතිනා

යමු යමු අපි පෙරමුණේ රට වෙනුවෙන් හැම දිනේ //

වෙහෙර මහා දේවිය සේ
බිය සංකා දුරු කරමු
ධීර වීර ගති පෙන්වා
රට ජාතිය රැක ගනිමු
සෙබලියනේ.....සෙබලියනේ
නොබා නොබා පෙළ ගැසෙමු
දිනූ බිමක බල මහිමය
හිරු සඳු සේ රැක ගනිමු//

සෝමා මහාදේවිය සේ
දිවි නොතකා පෙරට යමු
මව්බිම නාමයෙන් මුහුදේ වැලි
මිරිකා වතුර දෙමු
සෙබලියනේ.....සෙබලියනේ
නොබා නොබා පෙළ ගැසෙමු
දිනූ බිමක බල මහිමය
හිරු සඳු සේ වැළඳ ගමු//

පද රචනය : රඹුක්කන සිද්ධාර්ථ හිමි

# සුබ මොහොතින් නව තනතුරක



**කර්නල් බීඨීටීඑස්කේ බස්නායක ආර්එස්පී යූඑස්පී අයිජී**

ශ්‍රීලයුකාබහි 1 වන නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස 2024.05.06 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**මේජර් ඊඑම්එච්සී ද සේරම් පීඑස්සී ශ්‍රීලයුකාබ**

1 ශ්‍රීලයුකාබහි 29 වන අණදෙන නිලධාරිනිය ලෙස 2024.05.06 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**මේජර් ඩබ්ලිව්එම්ඩී වර්ණකුලසූරිය ශ්‍රීලයුකාබ**

1 ශ්‍රීලයුකාබහි දෙවන අණදෙන නිලධාරිනිය ලෙස 2024.05.02 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**මේජර් එල්කේකේ පෙරේරා එල්එස්සී ශ්‍රීලයුකාබ**

රෙම ශ්‍රීලයුකාබහි විධායක අධිකාරී ලෙස 2024.04.05 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**මේජර් එම්ජී දිල්රුක්ෂි ශ්‍රීලයුකාබ**

7 ශ්‍රීලයුකාබහි දෙවන අණදෙන නිලධාරිනිය ලෙස 2024.04.03 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**මේජර් එන්එස්එච් තඹවිට ශ්‍රීලයුකාබ**

1 ශ්‍රීලයුකාබහි නිලධාරී අණදෙන (පාලන) ලෙස 2024.06.10 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**මේජර් කේපීඩීඩබ්ලිව් ප්‍රනාන්දු ශ්‍රීලයුකාබ**

රෙම ශ්‍රීලයුකාබහි මානි II (පාලන) භාර නිලධාරිනිය ලෙස 2024.04.08 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්




**කපිතාන් එච්එම්එස්යු හඳකුඹුර ශ්‍රීලයුකාබ**

රෙම ශ්‍රීලයුකාබහි නිලධාරී නිවස්නභාර නිලධාරිනිය ලෙස 2024.06.25 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**කපිතාන් ඩීපී එදිරිවීර ශ්‍රීලයුකාබ**

කාන්තා බලකා පුහුණු පාසලේ කඳවුරුභාර නිලධාරිනි ලෙස 2024.04.29 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**කපිතාන් ජීජීටී උපේක්‍ෂා ශ්‍රීලයුකාබ**

රෙම ශ්‍රීලයුකාබහි මානි III (හකාස) ලෙස 2024.06.25 වන දින සිය ධුරයේ රාජකාරි අරඹමින්



**කපිතාන් අයිඒකේ ඉඳුරගේ ශ්‍රීලයුකාබ**

1 ශ්‍රීලයුකාබහි විධායක අධිකාරී ලෙස 2024.05.27 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**කපිතාන් කේඑල්එස්එම් ජයසේන ශ්‍රීලයුකාබ**

7 ශ්‍රීලයුකාබහි නිලධාරී අණදෙන (පාලන) ලෙස 2024.05.24 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**ලුතිතන් ඊඩබ්ලිව්ඒආර්සී විජේසිංහ විජයවීර ශ්‍රීලයුකාබ**

2 (සෙව්) ශ්‍රීලයුකාබහි විධායක අධිකාරී ලෙස 2024.06.12 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**ලුතිතන් කේඑස්එම් විජයවීර ශ්‍රීලයුකාබ**

රෙම ශ්‍රීලයුකාබහි මානි III (නිලධාරී ඉදිරි වෘත්තීය සැළසුම් අංශය) ලෙස 2024.05.16 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**ලුතිතන් එස්එම්ජීකේකේ සමරකෝන් ශ්‍රීලයුකාබ**

1 ශ්‍රීලයුකාබහි බුද්ධි නිලධාරිනි ලෙස 2024.04.24 වන දින සිය ධුරයේ රාජකාරි අරඹමින්

---



**බනි I එස් පුෂ්පකුමාරි**

7 ශ්‍රීලයුකාබහි රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස 2024.03.14 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්




**බනි I ඒඒඑස් දිල්රුක්ෂි**

3 (සෙව්) ශ්‍රීලයුකාබහි 12 වන රෙජිමේන්තු සැරයන් මේජර් ලෙස 2024.06.01 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්



**බනි ෂෂ ශිරෝමාලා ජේඑම්එම්**

3 වන ස්වේච්ඡා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ නව ප්‍රධාන සරඹ උපදේශක ලෙස 2024.05.20 වන දින සිය ධුරයේ රාජකාරී අරඹමින්

# සේවා වනිතා නව ගරු සභාපතිනිය රාජකාරි අරඹමින්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ 25 වන ගරු සභාපතිනිය ලෙස උදුලා කස්තුරිමුදලි මැතිණිය 2024 අප්‍රේල් මස 22 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථායේදී සිය ධුරයේ රාජකාරී කටයුතු ආරම්භ කෙරිණි.

# වෙසක් පොහොය දිනයට සමගාමීව දන්සලක්













ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ රෙජිමේන්තු මධ්‍යස්ථානය සහ පලමුවන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය එක්ව වෙසක් පොහොය දිනය නිමිත්තෙන් 2024 මැයි මස 23 වන වෙසක් පොහොය දින සවස රෙජිමේන්තු මධ්‍යස්ථානය බොරැල්ල ඉදිරිපිට දි සාර්ථකව සංවිධානය කෙරිණ. ප්‍රදේශයේ සිවිල් වැසියන්ගේ සහභාගීත්වයෙන් පැවති එම දන්සල සඳහා 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ උපදෙස් හා මගපෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සියලු නිලයන්ගේ සංවිධාන ශක්තිය, අනුග්‍රාහකත්වය සහ දායකත්වය මත සිදුකෙරිණි.

මෙම අවස්ථාව සඳහා එම සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි උදුලා කස්තුරිමුදලි මැතිණිය, මධ්‍යස්ථාන සේනාවිධයක ඇතුළු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා

# රණවිරු ස්මාරකය



සටහන - කපිතන් සී වී ජෝශප් ශ්‍රීලයුකාබ
තොරතුරු තාක්ෂණ නිලධාරිණී
රෙජිමේන්තු මධ්‍යස්ථානය

වීරත්වය, අභිමානය දැතින් දරාගෙන "සවි බල සිත් අවි බල දෙත්" යන උදාර පාඨය පෙරමුණු කරගනිමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා නාමයෙන් එදා අප රට වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවීරවරියන් 25 දෙනා සිහිපත් කිරීම උදෙසා වර්ෂ 2023 නොවැම්බර් මස 10 වන දින බොරැල්ල පිහිටි රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් වික්‍රම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ මැතිතුමන්ගේ සුරතින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා රණවිරු ස්මාරකය නිරාවරණය කරන ලදී.

ඔබත් මමත් අප සියලුදෙනා අද මෙලෙස නිදහස්ව හුස්ම ගන්නේ ඔවුනට පින්සිදු වන්නටය. ඔවුන්ගේ ජීවිතයේ හොඳම කාලය කැපකර තම දිවිදෙවෙනි කොට සලකා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය වෙත ආධුනික කාන්තා සෙබළියක ලෙස එක්ව මේ රට කුරිරු ත්‍රස්තවාදයෙන් මුදවනු පිණිස මානුෂීය මෙහෙවර සඳහාද සිය දායකත්වය ලබාදුනි. අද දවසේ අප සෑම කෙනකුම මෙලෙස සතුටින් නිදහස්ව ගතකරන්නේ ඔවුන් සෑම කෙනකුම කළ උත්තරීතර කැපකිරීම නිසාවෙනි. එලෙස කාන්තා බලකා නාමයෙන් රට වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවීරවරියන් 25 දෙනා සිහිපත් කරනු පිණිස ඉදිකරන ලද මෙම කාන්තා බලකා රණවිරු ස්මාරකය රෙජිමේන්තු ඉතිහාසය තුළ තවත් සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරවූවකි.

අප මව්බිමේ තිර පැවැත්ම වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කල වීරෝදාර රණවීරවරියන් 25 දෙනා සිහිපත් කරනු වස් ඉදිකරන ලද මෙම ස්මාරකය ඉදිකර තිබෙන්නේ ඓතිහාසික බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ බොරැල්ල පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන කඳවුරු භූමි පරිශ්‍රය තුළයි.



ස්මාරකයට පිටුපසින් ගලා හැලෙන දිය ඇල්ලක් ඉදිකර ඇති අතර, එමගින් සමුදුරෙන් වටවූ මාතෘභූමිය මත අභීත හස්තය දරා සිටින රණවිරවරියන්ගේ අප්‍රමාණ වූ වෙහෙස නිරූපණය වේ.

ශිලාගතකොට තිබෙන පුවරුවේ සඳහන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා ලාංඡනය තුළින් පාසල් අවධියෙන් පසු තම දෙමාපියන්ගේ ආශීර්වාදය ලබාගෙන මව්බිමේ එක්සේසත් බව රැකීම උදෙසා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අභීත සෙබළියක් ලෙස බැඳී මූලික යුධ පුහුණුව අවසන්ව මාතෘභූමියේ ස්වෛරීභාවය උදෙසා සිය ප්‍රාණවායුව පුදකළ විහාරමහාදේවී පරපුරේ වීරවරියන්ගේ නොපසුබට වීරත්වය විදහා දක්වයි.

ස්මාරකයේ පිටුපසින් අවි 03 ක් රඳවා තිබෙන අතර, එයින් විහාරමහා දේවි පරපුරේ කාන්තා වීරවරියන්ගේ තීක්ෂණ අවධානය හා සමස්ත භූමිය පුරා තම වගකීම් අභීතව ඉටුකරන බව විදහා දක්වයි.

ස්මාරකයේ පිටුපසින් ලෙලදෙන කාන්තා බලකා ධජ 05 තුළින් රෙජිමේන්තු මධ්‍යස්ථානය ඇතුළු නිත්‍ය ඒකක 02 සහ ස්වෙච්ඡා ඒකක 02 තුළින් රටේ සියලු ජන කොටස්වල ආරක්ෂාව වෙනුවෙන් කාන්තා බලකායේ වීරවිරියන් නිරන්තරයෙන් ඇප කැප වී සිටින බව නිරූපණය වේ.

තවද, අනාගත දූ පුතුන් වෙනුවෙන් සාමකාමී නිවහල් දේශයක් උරුමකර දීමේ උදාරතර අරමුණෙහි ස්වකීය දිවිය කැපකොට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ වීරෝදාර රණවිරවරියන් 25 දෙනකුගේ නම් සදා නොමැකෙන අයුරින් ශිලාගත කොට ඇති පුවරුවක් ඉදිකර ඇත.

මේ සියලු දේ කියාපාන්නේ ඉරහඳ පවත්නා තුරාවට කාන්තා බලකායේ මේ රණවිරු ස්මාරකය පවත්නා බවයි.



# 3(සෙව්) ශ්‍රීලයුකාබ වෙතින් සමාජ මෙහෙවරක්







ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනගේ මඟපෙන්වීම මත 3(සෙව්) කාන්තා බලකායට අයත් සෙ/ආර්102328 කාසෙ ලක්මාලි ඩීඑම්එන් යන සෙබළියගේ ඉදිකෙරමින් පවතින අර්ධ නිවාසයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් රුපියල් 450000.00 ක මුල්‍ය පරිත්‍යාග යක් පසුගියදා සිදුකෙරිණ. මෙම ව්‍යාපෘතිය යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සහ 3(සෙව්) කාන්තා බලකායේ අධීක්ෂණය යටතේ ආසේමු (නැ) යටතේ ස්ථාපිත ඉංජිනේරු සේවා රෙජිමේන්තුව, 3(ස්වේ)විජයබාහු පාබල රෙජිමේන්තුව හා 3(ස්වේ) ශ්‍රීලයුකාබ ඒකකයේ ශ්‍රම දායකත්වය මත ඉදිකළ නව නිවස එම පවුල වෙත පවරාදීම 2024 අප්‍රේල් මස 11 වන දින සිදුකෙරිණ.

මෙම අවස්ථාව සඳහා 3(ස්වේ) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ඒකක අණදෙන නිලධාරිනිය වන මේජර් එච්එච්එච් ද සිල්වා ශ්‍රීලයුකාබ ඇතුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරිනියන් හා සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# වෙසක් පොහොය දිනයට සමගාමීව දන්සැලක්





වෙසක් පොහොය දිනය නිමිත්තෙන් 2024 මැයි මස 23 වන දින 2(සෙව්) ශ්‍රීලයුකාබ ඉදිරිපිටදී සාර්ථකව සංවිධානය කෙරිණ. එම දන්සල සඳහා ප්‍රදේශයේ සිවිල් වැසියන් විශාල පිරිසක් සහභාගී විය. මෙම ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ මූලික සංවිධානය, අනුග්‍රාහය සහ දායකත්වය මත දන්සැල පැවැත්විණ.

# සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවයක්





සිංහල හා දමිළ අළුත් අවුරුද්ද නිමිති කොටගෙන 2(සෙව්) ශ්‍රීලයුකාබහි රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් මෙන්ම සිවිල් සේවක මහත්ම මහත්මින්ගේද සහභාගීත්වයෙන් 2024 අප්‍රේල් මස 11 වන දින අවුරුදු උත්සවයක් ඒකක පරිශ්‍රයේදී පැවැත්විණ. සාම්ප්‍රදායික ක්‍රීඩා හා විනෝදාත්මක අංගයන් රැසකින් සමන්විත වූ මෙම අවුරුදු උත්සවය සඳහා ඒකක අණදෙන නිලධාරිනි, දෙවන අණදෙන නිලධාරි ඇතුළු සියලුම ඒකක සාමාජික සාමාජිකාවන් සහ දමිළ කාන්තා සෙබළියන්ද එක්වූහ.



# සේවා වනිතා මතක

## ශ්‍රීලයුකාබ සේවා වනිතා ශාඛාවෙන් කාන්තා බලකා ගර්භණී සෙබළියන් හට සමාජ මෙහෙවරක්





යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදුලා කස්තුරිමුදලි මැතිනියගේ නායකත්වය හා මගපෙන්වීම මත එම රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ ඇති ඒකකයන්හි රාජකාරී කටයුතු සිදුකරන ගර්භණී කාන්තා සෙබළියන් සඳහා ඔවුන් දරු ප්‍රසූතිය සඳහා රෝහල්ගත වීමේදී අනිවාර්යෙන් රැගෙන යා යුතු ළදරු භාණ්ඩ ඇතුලත් ත්‍යාග කට්ටල බෙදාදීමේ හා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ඇතුලත් වියලි සලාක මළු ප්‍රධානය කිරිමේ වැඩසටහනක් 2024 මැයි මස 02 වන දින බොරැල්ල පිහිටි මෙම රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී සිදුකෙරුණි. යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ පෞද්ගලික ධන පරිත්‍යාගයක් සහ එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ දායකත්වය මත මෙම සමාජ මෙහෙවර ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් සංවිධානය කරන ලද අතර, එම සලාක මළු ගර්භණී කාන්තා සෙබළියන් 16 දෙනකු සඳහා ප්‍රදානය කරන ලදී.





2024 මැයි මස 14 වන දින 7 වන යුද්ධ හමුදා කාන්තා බලකා සෙබළියන් සඳහා ත්‍යාග පිරිනැමුණු අවස්ථාව.





3(සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකායේ ගර්භණී සෙබළියන් වෙනුවෙන් වියලි සළාක හා ත්‍යාග පාර්සල් බෙදාදුන් අවස්ථාව.





2024 මැයි මස 15 වන දින 2(සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකායේ ගර්භණී සෙබළියන් 16 දෙනකු සඳහා වියලි සළාක හා ත්‍යාග පාර්සල් බෙදාදුන් අවස්ථාව.

# යුද්ධ හමුදා කාන්තා බලකායේ අභිනවයෙන් නව පුස්තකාල විවෘත කෙරේ

යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදුලා කස්තුරිමුදලි මැතිණියගේ අදහසකට අනුව එම බලකා සෙබළියන් සඳහා පුස්තකාල පහසුකම් ලබාදීමේ අරමුණින් නව පුස්තකාල ආරම්භ කිරීමට කටයුතු කෙරිණ. ඒ අනුව 1, 7 ශ්‍රීලයුකාබ හා 2, 3 (සෙව්) ශ්‍රීලයුකාබ ඒකකයන්හි නව පුස්තකාල ආරම්භ කරන ලදී.





කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය විසින් 1 ශ්‍රීලයුකාබහි නව පුස්තකාලය 2024 ජුනි මස 12 වන දින විවෘත කෙරිණ.





කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය විසින් 7 වන යුද්ධ හමුදා කාන්තා බලකායේ ඉදිකරනු ලැබූ නව පුස්තකාලය 2024 ජුනි මස 15 වන දින විවෘත කෙරිණ.





2(සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකායේ ඉදිකරනු ලැබූ නව පුස්තකාලය 2024 ජුනි මස 16 වන දින එම බලකා සේවා වනිතා සභාපතිනියගේ සුරතින් විවෘත කෙරිණ.





3(සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකායේ ඉදිකරනු ලැබූ නව පුස්තකාලය 2024 ජුනි මස 16 වන දින එම බලකා සේවා වනිතා සභාපතිනිය අතින් විවෘත කෙරිණ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී විසින් පසුගියදා රෙජිමේන්තුවට අයත් 7 ශ්‍රීලයුකාබ හා 2, 3 (සෙව්) ශ්‍රීලයුකාබ ඒකකයන්හි මෙන්ම කාන්තා බලකා පුහුණු පාසල කළුඅග්ගලහි සංචාරයන්හි නිරත විය.

# ඒකක තතු අභිමනින්



## ශ්‍රීලයුකාබ පුහුණු පාසල



2024 මැයි මස 30 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා පුහුණු පාසල කළුඅග්ගලහි නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින්.

## 7 ශ්‍රීලයුකාබ

2024 මැයි මස 20 වන දින 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින්.





## 2 (සෙව්) ශ්‍රීලයුකාබ





2024 මැයි මස 21 වන දින 2 වන ස්වේච්ඡා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ නිරීක්ෂණ චාරිකාවක නිරත වෙමින්.

## 3 (සෙව්) ශ්‍රීලයුකාබ





2024 මැයි මස 22 වන දින 3 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත විය.

# බලකාධිපති විසින් 2024 රෙජිමේන්තු මන්ත්‍රණ සභාව පවත්වයි



56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් බොරැල්ල පිහිටි රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී 2024 මැයි මස මස 27 වන දින, 2024 රෙජිමේන්තු මන්ත්‍රණ සභාව පවත්වන ලදී. මෙම මන්ත්‍රණ සභාවේදී රෙජිමේන්තුවට අදාළ වැදගත් කරුණු රාශියක් සාකච්ඡා කරන ලද අතර, එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ පුහුණු පරිපාලන සහ සැපයුම් උපාය මාර්ග වැඩිදියුණු කිරීමේ ක්‍රමවිධි පිළිබඳව සාකච්ඡා කරන ලදී.

# නව අණදෙන නිලධාරිනි රාජකාරී අරඹමින්





1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ 29 වන අණදෙන නිලධාරිනිය ලෙස මේජර් ඊඑම්එච්සී ද සේරම් පීඑස්සී ශ්‍රීලයුකාබ අභිනවයෙන් සිය ධූරයේ රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී. භටපිරිස් අමතමින් රැකියාවේ ඇති වැදගත්කම, සුභසාධනය, මූල්‍ය කළමනාකරණය සහ තම රාජකාරි ජීවිතය මෙන්ම පුද්ගලික ජීවිතය යන දෙකෙහිම සෙබළියන් සමබරව ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ ඔවුන් දැනුවත් කරන ලදි. තවද, එහිදී කාන්තා සෙබළියන් හට ඔවුන්ගේ රාජකාරිමය මෙන්ම පුද්ගලික ගැටළුකාරී තත්වයන් පිළිබඳ ඒකක අණදෙන නිලධාරිනිය විසින් කරුණු විමසා බැලීය.





2024.04.25 වන දින යුගදිවි ගමන් ඇරඹූ 3 (ස්වේ) ශ්‍රීලයුකාබ ඒකකයේ කපිතාන් එන්යූ කුමාරගේ හා 7 ශ්‍රීලංසිරෙ ඒකකයේ කපිතාන් ටීඑස් බෝගහවත්තගේ.

# රන් හුයෙන් බැඳි දෑඟිලි...



2024.06.26 වන දින යුගදිවි ගමන් ඇරඹූ 2 (ස්වේ) ශ්‍රීලයුකාබ ඒකකයේ කපිතාන් කේකේඩීඑස්ආර් ජයතිලක හා 15 ශ්‍රීලපාහ ඒකකයේ කපිතාන් පීඊඅයි කුමාරතුංග.



2024.06.20 වන දින යුග දිවි ගමන් ඇරඹූ 3 (සෙව්) ශ්‍රීලයුකාබ ඒකකයේ කපිතාන් බිඒපිපිජේ ප්‍රේමසිරි ශ්‍රීලයුකාබ (නි/10907) හා උදය කුමාර මහතා



2024.05.10 වන දින යුගදිවි ගමන් ඇරඹූ 3 (ස්වේ) ශ්‍රීලයුකාබ ඒකකයේ සෙ/ආර්102294 කාසෙ සමරතුංග එස්ජ්කේආර් සහ ඩීඑම්එස් චාරුක දිසානායක මහතා

2024.05.10 වන දින යුගදිවි ගමන් ඇරඹූ 3 (ස්වේ) ශ්‍රීලයුකාබ ඒකකයේ සෙ/ආර්101936 කාසෙ ශානිකා කේකේඩී සහ කේජ් තිලංක නවෝදය බණ්ඩාර මහතා



2024.05.10
වන දින
යුගදිවි
ගමන් ඇරඹූ
සෙ/725379
සැරයන්
වීරසිංහ
අයිඩීපිඑන් සහ
එම මහතා





පසුගියදා
යුගදිවි
ගමන් ඇරඹූ
සෙ/726242
කාසෙ
විජේසිරි
ජේපීටීඑ සහ
එම මහතා



2024.04.09
වන දින යුගදිවි
ගමන් ඇරඹූ
සෙ/ආර්100626
කෝප්‍රල්
දිල්රුක්ෂි
ඩබ්ලිව්ඩීටී
සහ රුෂාන්
මධුසංක මහතා

2024.05.16 වන
දින යුග දිවි
ගමන් ඇරඹූ
සෙ/ආර්100513
කෝප්‍රල්
ප්‍රියදර්ශණී
ඩබ්ජේ සහ
සෙ/530763
කොප්‍රල් බංඩාර
එමඑම්ජීඑස්



2024.05.26
වන දින
යුගදිවි
ගමන් ඇරඹූ
සෙ/725775
සැරයන්
වර්ණසූරිය
එන්ජේර්පිසි





2024.04.11 වන
දින යුගදිවි
ගමන් ඇරඹූ
සෙ/ආර්101896
කාසෙ
ලක්මාලි ජීඑන්
සෙ/530667
කෝප්‍රල්
සමරකෝන්
එස්එම්පිඅයි

# HOW TO ACHIEVE HAPPINESS?

*A Journey Towards Fulfillment*



Every creator that classified as "Homo Sapiens" needs happiness. It's a kind of a magic that nobody refuses. People; irrespective of their age, colour of skin, gender, nature of profession, the wealth they owned, seek happiness whatever the actions we are doing is a consequence of our minds tendency to make us happy. Though we always seek happiness, the bitter through is most of the people in the world live in unhappy.

Happiness, has intrigued philosophers, scientists, and individuals for centuries. It's a complex, multifaceted concept that transcends mere pleasure or fleeting moments of joy. True happiness, often referred to as 'eudaimonia' in philosophical terms, encompasses a sense of fulfillment, purpose, and overall well-being. Achieving this profound state requires a holistic approach, incorporating mental, emotional, physical, and social dimensions of life. This article delves into the various strategies and philosophies that can guide one towards lasting happiness.

## Understanding the Concept of 'Happiness'

Before embarking on the journey to happiness, it's essential to understand what it entails. Happiness is not just about experiencing positive emotions but also involves living a meaningful life. Psychologist Martin Seligman, in his Positive Psychology framework, outlines five key elements of well-being, summarized by the acronym PERMA. They are Positive Emotions, Engagement, Relationships, Meaning, and Accomplishment.

**Positive Emotions:** These include feelings of joy, gratitude, and contentment. While they contribute to happiness, they are just one aspect of a fulfilling life.

**Engagement:** This involves being deeply involved in activities that utilize your strengths and skills, often referred to as being in a state of "flow."

**Relationships:** Meaningful connections with others are crucial for well-being. Strong social bonds provide support, love, and a sense of belonging.

**Meaning:** Having a purpose or direction in life significantly impacts happiness. This could be through work, family, or contributing to something larger than oneself.

**Accomplishment:** Setting and achieving goals gives a sense of pride and satisfaction, contributing to overall happiness.

## The Role of Mindset

A significant factor in achieving happiness is cultivating the right mindset. Research has shown that our thoughts and attitudes play a crucial role in how we perceive and experience life. Here are some ways to develop a positive mindset:

## Practicing Gratitude

Gratitude is a powerful tool for enhancing happiness. By focusing on what we are thankful for, we shift our attention from what we lack to what we have. Keeping a gratitude journal, where you regularly write down things you are grateful for, can foster a more positive outlook on life.

## Embracing Positivity

Positivity doesn't mean ignoring life's challenges but rather approaching them with a constructive attitude. Positive thinking involves acknowledging difficulties while maintaining hope and optimism. This can be cultivated through practices like positive affirmations and surrounding oneself with positive influences.

## Mindfulness and Meditation

Mindfulness involves being present in the moment and fully engaged with whatever we are doing. Meditation, a practice often associated with mindfulness, has been shown to reduce stress, improve focus, and increase overall well-being. By regularly practicing mindfulness and meditation, we can cultivate a calmer, more centered mind.

## Finding Purpose and Meaning

A sense of purpose gives direction to our lives and contributes significantly to happiness. Finding meaning involves understanding what is truly important to you and aligning your actions with those values. Here are some ways to cultivate purpose:

## Achieving Balance and Well-Being

Happiness also involves taking care of your physical and mental well-being. A balanced lifestyle that nurtures both body and mind is essential. Here are some tips for achieving this balance:

## Maintaining Physical Health

Regular exercise, a balanced diet, and adequate sleep are fundamental to physical health. Exercise not only keeps your body healthy but also releases endorphins, which enhance mood. A nutritious diet provides the energy and nutrients needed for overall well-being, while sufficient sleep is crucial for mental and physical restoration.

## Managing Stress

Chronic stress can significantly impact happiness. Developing healthy coping mechanisms, such as exercise, hobbies, or relaxation techniques, can help manage stress effectively. Mindfulness practices and meditation can also reduce stress and improve overall well-being.

## Seeking Professional Help When Needed

There is no shame in seeking help from mental health professionals. Therapy or counseling can provide support and strategies for dealing with life's challenges, improving mental health, and enhancing overall happiness.

## Conclusion

Chasing behind the money is the prime reason that a person cannot live a happy life. Physical wealth is not the most important factor in one's life. But people never think beyond money and wealth. However, when they realize, the physical wealth is not the reason for happiness and they should develop human qualities, it is too late.

The pursuit of happiness is a lifelong journey that involves continuous self-reflection, growth, and adaptation. By understanding the components of happiness and adopting practices that foster a positive mindset, strong relationships, a sense of purpose, and overall well-being, you can navigate this journey more effectively. Remember, happiness is not a destination but a way of life, cultivated through daily actions and attitudes.



Maj EMHC De Seram psc SLAWC
Commanding Officer
1 SLAWC



# යකඩ පිහාටු

## ශ්‍රී ලංකා පැරෂුට් කලාව

සටහන -
2/ලුතිනන් කේ්පීඑන් රුදිගු
3 (සෙවි) ශ්‍රීලයුකාබ

සතුරු භූමිය පිටුපස සංග්‍රාමික ක්‍රියාන්විත සිදුකිරීම සඳහා යොදාගන්නා සුවිශේෂී හමුදා කණ්ඩායමක් ලෙස පැරෂුට් භටයන් හැඳින්විය හැකිය. මෙය බොහෝ රටවල් තම හමුදා ශක්තිය තීව්‍ර කරගැනීම සඳහා ක්‍රියාකරනු ලබයි. මෙම පැරෂුට් භටයින් විශේෂ ක්‍රියාන්විත උපක්‍රම භාවිතා කරමින් ගුවනේ සිට පැනීම්වාර සිදුකිරීමට පුහුණුව ලබා ඇත. මේ හරහා සතුරු ස්ථාන, බර අවි තබා ඇති ස්ථාන ද හඳුනාගෙන විනාශ කිරීමටද හැකියාවක් මෙම පැරෂුට් භටයින් සතුව ඇත.

පැරෂුට් වංශ කතාවෙ ඉතිහාසය ගත්කළ එය වර්ශ 1970 දශකය දක්වා දිවයනු ලබන අතර, කමාන්ඩෝ රෙජිමේන්තුවට අයත් නිලධාරින් 03 ක් සහ සෙසුනිලයින් 24 ක් ඉන්දියාවෙ ආග්‍රා පැරෂුට් පුහුණු පාසලෙන් පුහුණුව ලබා පැරෂුට් භටයින් ලෙස 1979.12.29 වන දින විසිරයාමත් සමඟ ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසය ආරම්භ විය. පැරෂුට් ඉතිහාසයේ පියා ලෙස සැලකෙනුයේ, පැරෂුටයේ නිර්මාතෘකරුවෙකු වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිලධාරී මේජර් එස්ඩී පීරිස් පීඑස්සී නිලධාරීතුමන්ය. එපමණක් නොව ඉන්දියාවේදී පැරෂුට් පුනරීක්ෂණ පුහුණුවීම්ද, පාකිස්තානය වෙතින් පැරෂුට් එතීම නඩත්තු කිරීමේ පාඨමාලාවද, ජම්ප් මාස්ටර් පාඨමාලාවද හදාරා ඇත. ශ්‍රී ලංකා පැරෂුට් ඉතිහාසයේ නිදහස් ආර පැරෂුට් කලාවේ පියා ලෙස සැලකෙන්නේ කමාන්ඩෝ රෙජිමේන්තුවේ මේජර් එන්ජී චන්ද්‍රසේන ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පීය. මෙතුමා ඇමෙරිකාවෙදි මෙම පාඨමාලාව හදාරා ඇත.

නිදහස් ආර පැරෂුට් පාඨමාලාව ප්‍රථම වරට ඉන්දියාවේදී හැදෑරීමට කමාන්ඩෝ නිලධාරියෙකුට හා සෙසුනිලයන් 04 දෙනෙකුට අවස්ථාව හිමිවිය. ප්‍රථම වතාවට ඉන්දියාවේදී පාත්ෆයින්ඩර් පාඨමාලාව හැදෑරීමට ද කමාන්ඩෝ නිලධාරියෙකුට හා සෙසුනිලයෙකුට අවස්ථාව උදාවිය. 1991 වර්ශයේදීම ඇමෙරිකාවෙන් නිදහස් පැරෂුට් 08 ක් මිලදී ගත් අතර රත්මලාන ගුවන් පථයේදී ප්‍රථම වතාවට නිදහස් ආර පැනීම් පුනරීක්ෂණය සිදුකරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් ඉතිහාසයේ ප්‍රථම නිදහස් ආර පැරෂුට් සංදර්ශනය සිදුකරන ලද්දෙ 44 වන නිදහස් උත්සවය වර්ණවත් කරමින්ය. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් ඉතිහාසයේ නව පරිච්ඡේදයක් ආරම්භ කරමින් යුද්ධ හමුදා කාන්තා බලකායට අයත් නිලධාරීන් 01 ක් සහ සෙසුනිලයින් 3 ක් 2005 වර්ශයේදි මෙම පාඨමාලාව හදාරන ලදී. කපිතාන් ජීඑම්එන් විදානගමගේ, කෝප්‍රල් හේමන්ති ආර්ජීඑන් සහ කෝප්‍රල් කහවල ජේජීම් ප්‍රථම කාන්තා පැරෂුට් භටයින් වේ. වර්තමානයේ කුඩාඔය කමාන්ඩෝ පුහුණු පාසලේ පිහිටා ඇති පැරෂුට් අංශය මගින් විවිධ පාඨමාලාවන් රැසක් සිදුකරනු ලබන අතර, ඒවා නම්

1. මූලික පැරෂුට් පාඨමාලාව
2. නිදහස් ආර පැරෂුට් පාඨමාලාව
3. පැරෂුට් එතීම හා නඩත්තු කිරීමේ පාඨමාලාව
4. ජම්ප් මාස්ටර් පාඨමාලාව
5. පාත්ෆයින්ඩර් පාඨමාලාව

යනාදියෙහි පුහුණුව ලබාදෙනු ලබයි.

මින් පැරෂුට් භටයෙකු ලෙස පැරෂුට් පවුලට එකතුවීම සඳහා මූලික වශයෙන් මූලික පැරෂුට් පාඨමාලාව හදාරා සිටිය යුතුය. මෙහිදී පොළව මට්ටමෙන් අඩි 1000 ක් ඉහළ ගුවනේ සිට පැරෂුටයක් ආධාරයෙන් ගුවනින් නික්මිය යුතුය. මෙහිදී පැනීම් වාර 05 ක් සිදුකළ යුතු අතර, එහිදී දිවා කාලයේ පැනීම්වාර 04 ක්ද සිදුකළ යුතුය. එහිදී එක් පැනීමක් සිදුකළ යුත්තේ පැක් එක සහ අවියක් රැගෙනය. එක් පැනීම් වාරයක් රාත්‍රී කාලයේදී සිදුකරනු ලබන අතර, තම පැරෂුටය හසුරවමින් රාත්‍රීයේ නිසි ස්ථානය සොයාගෙන පැමිණිය යුතුය.

මෙම පාඨමාලා කාලය මාස 02 කට ආසන්න කාලයක් සිදුකරනු



ලබන අතර එහිදී පැරෂුටය ඇදගන්නා ආකාරය, ගුවන්යානයට නගින ආකාරය, ගුවනින් නික්මෙන ආකාරය, පැරෂුටය හසුරුවමින් පතිත කලාපයේ නිවැරදි ස්ථානය වෙත පැමිණෙන ආකාරය, ඉස්මතු වියහැකි ආබාධ මගහැරීමින් ඒවාට ගතයුතු ක්‍රියාමාර්ග, ආබාධයක් පැමිණියහොත් එයට මුහුණදෙන ආකාරය, පතිතවෙන විට තම පාද තබාගත යුතු ආකාරය, රෝල් 6 ක් මඟින් පුහුණු කාලය තුළදි සිදුකරනු ලබයි.

මූලික පැරෂුට් පාඨමාලාවෙන් අනතුරුව සුදුසුකම් ලබන නිලධාරීන් සෙසුනිලයන් හට නිදහස් ආර පැරෂුට් පාඨමාලාව හැදෑරීමට අවකාශය හිමිවෙනු ඇත. එය මූලික පැරෂුට් පාඨමාලාවට වඩා හාත්පසින්ම වෙනස් වූ පාඨමාලාවකි. *SKYDIVER* ටැග් එක ලබා ගැනීම සඳහා පැනීම්වාර 30 ක් සම්පූර්ණ කළ යුතුය. නිදහස් පැරෂුට් පාඨමාලාවේදී ගුවනේදී ශරීරය තබාගත හැක්කෙ කෙසේද, අත් පා තිබිය යුත්තේ කෙසේද, පැරෂුටය ඇදගන්නා ආකාරය, ඇල්ටිමීටරය මඟින් තමන් ඉන්න උස පිළිබඳව දැනගන්නා ආකාරය, ආබාධයක් පැමිණි විට එය විසඳගන්නා ආකාරය, හදිසි අවස්ථාවකදි අමතර පැරෂුටය ක්‍රියාත්මක කරගන්නා ආකාරය, තම පැරෂුටය ඔතා ගන්නා ආකාරය, හැරීම් සිදුකරනු ලබන ආකාරය, පැරෂුටය හසුරවමින් පතිත කලාපයේ නියමිත ස්ථානය වෙත ළඟාවීමට උස අඩු කරමින් පැරෂුටය හැසිරවිය යුතු ආකාරය, නියමිත උසේදී බ්රේක් ගැසිය යුතු ආකාරය, ගුවනේදී සිදුකළ යුතු ක්‍රියාකාරකම් ආදියත්, තම පැරෂුටය නියමිත උසේදී අල්ටිමීටරය භාවිතා කරමින් එය දිගහැරගත යුතු ආකාරය ද පාඨමාලා කාලය තුළදී ඉගැන්වීම් සිදුකරනු ලබයි.

මූලික පැරෂුට් පාඨමාලාව තුළදී, අප පැරෂුටය තම ක්‍රියාකාරිත්වයෙන් තොරව ක්‍රියාත්මක වන අතර, නිදහස් ආර පැරෂුට් පාඨමාලාවේදී එම පැරෂුට් භටයා කිනම් උසකින් ගුවන් යානයෙන් නික්මුනද තමාට ලබාදෙන නියමිත උසේදී තමා විසින්ම තම පැරෂුටය දිගහැර ගත යුතුය. නිදහස් ආර භටයෙකු පැනීම් වාර 30 ක් සැපිරිය යුතු අතර, මෙහි ආරම්භක පැනීම ආරම්භ වනුයේ අඩි 5000 කිනි. උපරිම උස අඩි 15,000 දක්වා දිව යයි. අඩි 15,000 ට ඉහළින් පැනීම් සිදුකරන්නේ නම් ඔක්සිජන් භාවිතා කළ යුතුය. මෙම පැනීම් 30 ඇතුළත ඉහල ගුවනේ සිට පරීක්ෂණයකට මුහුණදිය යුතු අතර, මෙහිදී වමට, දකුණට, ඉදිරියට, පිටුපසට, *forward roll, backward roll,* අංශක 360ට කැරකීම යනාදිය තමා නිරීක්ෂණය කිරීමට පැමිණෙන නිදහස් ආර භටයා ඉදිරියේ සිදුකළ යුතුය. පැනීම්වාර 30 ක් සම්පූර්ණ කරනු ලබන සිසුවෙකු ආරම්භයේදී 250 පැරෂුටයෙන් මාරු වී 220 පැරෂුටය පැදීම ආරම්භ කරනු ලබයි. පැනීම්වාර වැඩිවෙනවාත් සමගම පැරෂුටයෙන් පැරෂුටයකට මාරු වෙනු ලබයි. ඒවා නම්,

1.250
2.220
3.190
4.175
5.170 යනාදිය වේ.

නිදහස් ආර භටයෙක් හට ගුවනේදී විවිධ ක්‍රියාකාරකම් සිදුකළ හැකි අතර, *formation, accuracy* වැනි දෑ සිදුකළ හැකිය. මීට අමතරව *wind suite, base-jump* වැනි පාඨමාලාවන්ද හැදෑරිය හැක.

එසේම පැරෂුට් එතීම හා නඩත්තු කිරීමේ පාඨමාලාව තුළින් පැරෂුට් ඔතන ආකාරය, නඩත්තු කරන ආකාරය කියාදෙන අතර, ජම්ප් මාස්ටර් පාඨමාලාව තුළින් සිදුවනුයේ පැරෂුට් පිමි පැන්නවීම් භාර නිලධාරියෙකු හෝ ජ්‍යෙකොනොනිවරයෙකු බිහිකිරීමයි. පුහුණු ප්‍රදේශය තුළ, ගුවන්තොටුපළ තුළ, ගුවන්යානය තුළ, පතිත කලාපය තුළ සිදුකල යුතු ක්‍රියාකාරකම් ඉගැන්වීම් කරනු ලබයි. ඔහු සතුව විශාල වගකීමක් ඇති අතර, පලවෙනි පිමි පනින්නා ගුවන්යානයෙන් එළියට දමන්නෙ කුමන ස්ථානයෙන්ද යන්න ඇතුලු සියලුම වගකීම් ඔහු සතු වේ. පාත්ෆයින්ඩර් පාඨමාලාව තුළින් අපගේ පැරා වින්ග් එක හරහා සිදුකරනුයේ ගුවන්යානය හරහා සම්බන්ධතා පවත්වා ගනිමින් ක්‍රියාකාරකම් සිදුකිරීමයි.

මෙම ක්‍රීඩාව තුළින් ජයග්‍රහණයන්ද ලබාගෙන ඇති අතර, 2018 එංගලන්තයේ නිවැරදි ඉලක්කයට පතිත වීමේ ඉසව්ව (*Accuracy*) හරහා රන් පදක්කමද 2019 අන්තර්ජාතික ආරක්ෂක සේවා පැරෂුට් තරගාවලියේදී නිවැරදි ඉලක්කයට පැනීම තුළින් ලෝකඩ පදක්කමද ලබාගෙන ඇත. මීට අමතරව දියකාවා මෙහෙයුම හටද මෙම භටයන් සහභාගි වෙනු ලබයි.

වර්තමානය වනවිට එයාර්බෝන් කළ නිලධාරීන් 808 ක් ද සෙසුනිලයන් 3930 කට ආසන්න ප්‍රමාණයක් මෙම පවුල තුළ සිටිනු ලබයි.





# සිතුවිලි දැහැන

## ආදර ඔලී...

හුරතල් මැණික මා ද සිඟිත්ති
දැවටෙයි නිරතම මා අසලව සිතැන්නී
කෙලිලොල් ඈ දවස ගෙවයි මුවැත්තී
අප දෙදෙනාගේ පණ ටික මේ රුවැත්තී

දිවයයි ලේ පුරා බෙලව් මල්ලන්ය
අම්මා නොමැති දින ගේ යුද පිටියක්ය
අප්පච්චී තුරුලේ සැනසෙන දඟ මල්ලය
මාගේ දිවියේ සොඳුරුතම කවිය

හවසට එනවිට මා මාගේ නිවසට
හරි හරියට කළ දඟ වැඩ එක විටම
අත්තම්මා දොඩයි ඒ ඇයගේ පණ ටිකට
සිඟිති ඇය හිනැහෙයි එකවිටම

දුවෙක් නම් පිට වත්තක නැදු මල්ලු
හැදු මලක් පිට දෙන්නේ හිතකින්ද
දින සති මාස ගෙවෙනා මේ අවුරුද්ද
මගෙ මලී මාගේ මැණියයි හැමදාම

සෙ/725709
කෝප්‍රල් කලුබෝවිල කේඑස්ජේ
1 ශ්‍රීලයුකාබ

## සෙබළ බිරිඳකගේ වාගලාපය...

නිසොල්මන් ගොම්මනේ මදුවිතත් ඉගිරෙන
සිහින සිතුවිලි වාන් දමනා රැයක පා නොගැටෙන
රණබිමේ නැගෙන පෙම් කවි නිමපු සඳ
ගියා ඔබ ඈතට කලා අභිනික්මන්

ප්‍රේමයක අතු ඉති වැඩෙනා
හිතේ හිරවුණු පෙම්කම්
සඳේ සවිය මමයි නුඹට පෙම් බැඳි
කලා ගෙත්තම්
නොවේ ඒ හැම සිහිනයක් මැයි
සදා තනිවුන ඒ කිරිල්ලිය
එක සසරේ තවත් ඒ කවි කවි

දුරක් නොසිතා හුගක් පෙම්කර
ලැබුණේ අනේ දුක නම්
ගෙවනු රැයකදී සිහින් කෙඳිරිලි නැගුණා
පැතුම් පොදි සිරවෙලා
සින්න විය යුද බිමට අප දෙදෙනා එක් කලක
එක සසරේ තවත් ඒ කවි කවි

සෙ/726276
කාසෙ ද සිල්වා කේඩීජ්සී
1 ශ්‍රීලයුකාබ

## කඳවුරට යළි යන්න...

දෙව්ඳුනේ අහගන්න.....
කොළ කැමා කමිසයට
උරතියන් හිනැහෙන්න
නිවාඩුවකට ඇවිත්
සිත මගේ සනසන්න.......
දෙව්ඳුනේ අහන්න....
හොරෙන් මට නොදැනෙන්න
රළු අත්ලේ පැටලෙන්න....
නුඹ නමින් ලියැවෙන්න..
කවියක්ව උපදින්න
කෙදින හෝ නුඹ වඩින
දොරකඩම නවතින්න
හිතයි මට හැමදාම නුඹ
නුඹේ රස්නේ දැවටෙන්න ....
දෙව්ඳුනේ අහගන්න
හැමදාම ළග උන්න
සුවද මට දි ඔයා
කඳවුරකට යළි යන්න........

සෙ/ආර්102838
කාසෙ ඥාණතිලක එච්පීබිටි

## සතුට හා කඳුල...

මේ ගමන් තුළ හමුවන සමුගත්ත
සෑම අයෙකුම
ජීවිතේට අත්දැකීමක්
එක්කරනවා විනා
ඒ හමුවීම් සමුගැනීම් හේතුවෙන්
අපි විඳින සතුට හා කඳුල
තව තවත් අපිට
ශක්තිමත් කරන්නේ
ජීවිතය යථාර්ථය
මැනවින් වටහාගන්න
අවස්ථාවකුත් උදාකරමින්මය...

සෙ/ආර්102561
සාසෙ සාවින්දි ඩබ්ලිව්ජීපී

## අප්පච්චී...

දරුපෙම වෙනුවෙන්
රතු රුධිරය කිරි නොවුනාට
දිවා රෑ නිදිවරා
අනේක දුක් පීඩා විඳිමින්
මවගේ පිටුපසින් සිට නිරතුරු
දරුවන්ගේ දියුණුව පතා
නිරතුරුවම
අවසන් හුස්ම වා තලයට
මුසුකරන අද්විතීය මිනිසා...

සෙ/ආර්100891
කෝප්‍රල් බෝබුවලගේ බීඩීඑස්පී

## ප්‍රේමයේ මතක මණ...

කැබලි උන සිහින පොදි
අතින් ගෙන සකසමි
බිඳුණු තැන් අතගා
පිරියම් කරන්නට වෙහෙසෙමි

හිතින් බැඳි බැමි
ලිහා දමන්නට වලිකමි
මහා බර සුසුම් පොදි
ලය තුළම වල දමමි

යළි නොයන ප්‍රේමයේ
උපන්ගෙයි මියදුනු
සිහිනවල මතක මණ
කියන්නට වෙහෙස වෙමි

විටින් විට නුඹේ මතකයේ
දෙනෙත් කෙවි තෙත් වේවි
ජීවිතයේ වසන්තය
ඒ සමඟ දියකරමි

නුඹ මාව අතහැර ගිය තැන
තාම රැඳී ඉමි
සියලු හිත් වේදනා
හිස් අහස වෙත යවමි

මුරුගසන් කඳුළු වරුසාවට තෙමෙමි
නුඹව සෝදා හරිමි
යළි මාව සොයා ගමි

මම නොමැති නුඹේ සිහිනවලට
මම සුබ පතමි
යළිත් මගෙ සිහින තුළ
නුඹ නොමැති බව කියමි

හි/70062
කපිතාන් ආර්ඩීඑම්සීඑස් උඩුගම
1 ශ්‍රීලයුකාබ

## බොළඳ ගැහැණිය...

ගැහැණු අපි බොළඳයිලු
කියනවා ඇහිලා තිබුණා කවියකු
බොළඳ අපි කොහොමද
කවියා නොදන්නවා වාගෙයි හරියකට

ලක්ජීවි සරස්වතී වගේ ඉන්නට
පිරිමින් දැනගත යුතුය සැමවිටම
කාලි අම්මා මගේ යක්‍ෂණියව
ඉපදීමට මුලක් ඔය පිරිමින්ය

තනා පොතේ හිටියාට කන්නගි
ගිනි මැලයට පැන්නාය සිතා පතිවතකට
නූතන ගෑණු අපි නැත ඔය විදිහට
අපිත් වැඩ කරයි සම අයිතිවාසිකමකට

ඉතිහාසයේ ගැහැණුන් සැමියන්ගේ දෙපා ලඟ
වැඳ වැටුනාට දැන බෑ එය කරන්නට
අපි සැම දැන් ටිකක් ස්මාර්ට්ය
බොළඳ ගෑණු නොව අපි දැන් යකඩ අය

මින් ඉදිරියට කවියාට පෑ නෙතුවට
නොහැකි වේවි බොළඳ ගැහැණියට
දුක් වී එලක් නැත ගැහැණිය වෙනස්ය
කවියකුගේ පොතට දැන් අහිමිය බොළඳ ලඳ

සෙ/725709
කෝප්‍රල් කලුබෝවිල කේඑස්ජී
1 ශ්‍රීලයුකාබ

## තාත්තා...

කාලයක් මේ නෙත් සනසවපු
ඒත් දවසක් මේ ඇස්
මහ ගොඩක් හඬවපු
හීන පුරවලම ආදරේ හුගක් දීපු
සතුට මට දීලා දුකම විතරක්ම විඳපු
හිමි වෙලත් අකාලයේ අහිමිවුණු
චරිතයක් තිබුණා තාත්තා කියලා
මහ මහ ගොඩක් දැණුනු

සෙ/726563
කාසෙ දෙනුවන්ති කේඩීඩබ්ලිව්
1 ශ්‍රීලයුකාබ

## රණවිරුවා...

මා දිවි දෙවෙනි කොට
ගිණි අවිය අතැතිව
නොබියව රුපු පෙරට
ලක්මව රකින්නට
ගොස් මා රණ බිමට
වැදු මව් තනිකර
අවි ගෙන පෙරමුනට
වෙඩි වැදුණි දෙපයට
තිබූ මගේ විරියට
මරු හා යුධ කොට
දිවි ලදිමි මා නැවත

සෙ/ආර්102474
කාසෙ තරංගනී එස්එම්

## මැණියනී...

රිදෙන රිදුමක් බරයි පපුවට
කඳුළු වැටුණා නෙත් අගින්
මතක පාරයි හුස්ම නවතී
වේදනා දැනුණා නිතින්
පැරි පැරි හඬන විඳවන
මහද අරගෙන නුඹේ අතින්
ඔසුත් කුමටද කියා සිතමින්
පිරිමැද්දේ මව් පිය සෙනෙහේ
චවන කෙලෙසක ගලපන්නේ මා
මැණියනී නුඹගේ නමින්
පුදන මහමෙර තරම් සෙනෙහස

සෙ/2134156
ආකාසෙ රූබසිංහ එම්කේපී
1 ශ්‍රීලයුකාබ








# 2 වන ආසියානු
## හෙල්ල වීසිකිරීමේ ශූරියට
## බලකායෙන් හරසර

වර්ෂ 1987 ජනවාරි මස 14 වන දින පරකඩුව ග්‍රාමයේදී ඩබ්එම් චන්ද්‍රා වීරසිංහ මැණියන්ට සහ එච්එල් බුද්ධදාස පියාණන්ට දාව උපත ලැබූ "නදීෂා දිල්හානි ලේකම්ගේ" පවුලේ දෙවැනි දරුවාය. ඇයට වයස අවු 40ක වැඩිමහල් සහෝදරයෙක් (එච්එල් මනොජ් ලක්මාල් ලේකම්ගේ) සහ අවු 31ක බාල සහෝදරයෙක් (එච්එල් ප්‍රගීත් දිල්ෂාන් ලේකම්ගේ) සිටී. ඇයගේ ප්‍රාථමික අධ්‍යාපනය පරකඩුව කණිෂ්ඨ විද්‍යාලයෙන් හදරා අපොස (සා/පෙළ) සඳහා පරකඩුව නාරද මධ්‍ය මහා විද්‍යාලයෙනුත් ඇහැළියගොඩ ඇරව්පොළ මහින්ද විද්‍යාලයෙනුත් අධ්‍යාපනය ලබා ඇත.

ඇය හෙල්ල විසිකිරීම සඳහා පාසල් කාලයේ සිටම දක්වා ඇත්තේ සහජ හැකියාවකි. ක්‍රීඩාවට උපන් හපන්කම් දක්වන ඈ හෙල්ල විසිකිරීමට අමතරව දිවීමේ තරගාවලි සඳහාද සහභාගී වී ජයග්‍රහණ රාශියක් ලබා ඇත. එහෙත් සෑම ක්‍රීඩාවක්ම සිදු කරමින් අවසානයේ ඇය ශාරීරික අභ්‍යාස පුහුණු උපදේශක අරුණ ශාන්ත ධර්මසේන උපදේශකතුමන්ගේ මගපෙන්වීම සහ අසීමිත කැපකිරීම මත හෙල්ල විසිකිරීමේ තරගාවලිය තෝරාගනු ලබන්නේ පාසලටත් රටටත් මුලු මහත් ජාතියටත් සම්පතක් ලෙසින්ය.

තම පාසල් දිවියට සමු දෙමින් ඇය 2006.12.30 වන දින ආධුනික කාන්තා සෙබළියක් වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳෙන්නේ තම දක්ෂතා අතින් යුද්ධ හමුදාවටත් රටටත් මුලු මහත් දේශටයත් කීර්තියක් ලබාදීමේ දැඩි අධිෂ්ඨානයෙන්ය. ඇයගේ අපේක්ෂාවන් මල්පල දරමින් පියවරෙන් පියවර ඇය තම දක්ෂතා වැඩි දියුණු කරමින් හෙල්ල විසිකිරීමේ තරගාවලි සඳහා ඉදිරිපත් වෙමින් ජහග්‍රහණ ලබාගනු ලබන්නේ සැබවින්ම උපන් හපන්නියක් ලෙසින්ය.



### ක්‍රීඩා දක්ෂතා

- 2024 වර්ෂයේ තායිවානයේ පැවැති මළල ක්‍රීඩා තරගාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2024 වර්ෂයේ කොරියාවේ පැවැති ආසියානු විසිකිරීමේ ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ තුන්වන ස්ථානය හිමිකර ගැනීම.
- 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවැති පලමු තේරීම් තරගාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.

- 2023 වර්ෂයේ චීනයේ පැවැති 25 වන ආසියානු මලල ක්‍රීඩා තරඟාවලිය හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2023 වර්ෂයේ හංගේරියාවේ පැවැති ලෝක මලල ක්‍රීඩා ශූරතාවලිය සඳහා හෙල්ල විසිකිරීමේ ඉසව්ව සඳහා සහභාගීත්වය.
- 2020 වර්ෂයේ පැවැති 98 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2019 වර්ෂයේ නේපාලයේ පැවැති 13 වන දකුණු ආසියානු මලල ක්‍රීඩා තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- 2019 වර්ෂයේ පැවැති 97 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2018 වර්ෂයේ පැවැති 10 වන ආරක්ෂක සේවා මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- 2018 වර්ෂයේ පැවැති 96 වන ජාතික මලල ක්‍රීඩා ශූරතවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- 2017 වර්ෂයේ ඉන්දියාවේ බුභනේෂ්වරන්හි පැවැති 22 වන ආසියානු මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2016 වර්ෂයේ කොරියාවේ පැවැති මොක්පෝ ජාත්‍යන්තර විසිකිරීමේ තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- 2016 වර්ෂයේ පැවති 94 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- 2012 වර්ෂයේ පැවැති යෞවන හා තරුණසේවා සභා සම්මේලන තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය (වයස අවුරුදු 20 වැඩි)
- 2011 වර්ෂයේ පැවැති යුද්ධ හමුදා මලල ක්‍රීඩා තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2011 වර්ෂයේ පැවැති 89 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2011 වර්ෂයේ පැවැති ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මලල ක්‍රීඩා තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2010 වර්ෂයේ පැවැති 88 වන ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2009 වර්ෂයේ පැවැති යුද්ධ හමුදා මලල ක්‍රීඩා තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.
- 2009 වර්ෂයේ පැවැති 27 වන කාන්තා මලල ක්‍රීඩා තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- 2008 වර්ෂයේදී පැවැති කණිෂ්ඨ ජාතික මලල ක්‍රීඩා ශූරතාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීම.
- 2007 වර්ෂයේ පැවැති 3 වන ආරක්ෂක සේවා මලල ක්‍රීඩා තරඟාවලියේ හෙල්ල විසිකිරීමේ ඉසව්වේ දෙවන ස්ථානය හිමිකර ගැනීම.



ලෝක මලල ක්‍රීඩා ශ්‍රේණිගත කිරීම්වලට අනුව 2024 වර්ෂයේ පැවැත්වීමට නියමිත පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙළ නියෝජනය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ හෙල්ල විසිකිරීමේ ක්‍රීඩිකා මාණ්ඩලික සැරයන් නදීශා දිල්හානි ලේකම්ගේ මේ වනවිට සුදුසුකම් ලබා ඇති බව මුළු රටක් දන්නා කරුණකි. එම පුහුණුවීම් ලැබීම් කාලය 2024 ජුනි 30 වන දින අවසන් වූ අතර, මෑතකාලීනව ඇයගේ තරඟ වාර්තා පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වීමට ඉවහල් වී තිබේ. ඇය ලෝක මලල ක්‍රීඩිකාවන් අතර ඉහළම ශ්‍රේණිගත කිරීම් ලබාගෙන මේ වනවිට 26 වන ස්ථානයේ පසුවේ. මෙරට මලල ක්‍රීඩා ඉතිහාසයේ නවමු පරිච්ඡේදයක් අරඹමින් මාණ්ඩලික සැරයන් නදීශා දිල්හානි ලේකම්ගේ දැක්වූ දක්ෂතා තව තවත් ඔප්නංවා ගනිමින් යළි යළිත් ජාත්‍යන්තර කෙළිබිමේ උසස්ම සහ විශිෂ්ටම ක්‍රීඩා තරඟාවලිය වූ 2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙළ තුළින් අප බලකායටත් සමස්ත යුද්ධ හමුදාවටත් අප රටටත් ගෞරවයක් ගෙන එන්නට, ලොවක් හමුවේ රනින් සරසන්නට, අප ධජය ඉහළට ඔසවා තබන්නට අවැසි සියලු ශක්තිය ධෛර්යය ආශීර්වාදය ඔබට ලැබේවායි බලකාධිපතිතුමන් ඇතුළු සියලු නිලයන්ගේ අප ඔබට ගෙන එන්නෙමු.

මීට පෙරද දේශයට ජයග්‍රහණ රැසක් අත්පත් කරදුන් ඔබට තවත් බොහෝ ජයග්‍රහන අත්පත් කරදීමට හැකියාව තිබේ. අභියෝග හමුවේ නොසැලී එළඹෙන පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙලහි හෙල්ල විසිකිරීමේ තරඟ ඉසව්වෙන් නව තරඟ වාර්ථාවක් බිහි කරමින් මේ ක්‍රීඩා ඉතිහාසයේ තවත් නැවුම් වූ පරිච්ඡේදයක් පෙරලන්නට ක්‍රීඩාව තුළින් ජය කෙහෙලි නංවන්වට ලක් මවගේ කීර්තිය ලොවට ගෙන යාමට ඔබට ජවය ශක්තිය ලැබේවාතව.



සටහන - කපිතන් සී වී ජෝශප් ශ්‍රීලයුකාබ
තොරතුරු තාක්ෂණ නිලධාරිණී
රෙජිමේන්තු මධ්‍යස්ථානය



කෙළි බිම

# අන්තර් බලඇණි දැල්පන්දු ශූරතාවලිය 2024

යුද්ධ හමුදා කාන්තා බලකායේ "අන්තර් බළඇණි දැල්පන්දු ශූරතාවලිය - 2024" අවසන් මහා තරගය එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් මැයි මස 30 වන දින සාර්ථකව පැවැත්විණි.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 56 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ යුද්ධ හමුදා කාන්තා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සමඟින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි උදුලා කස්තුරිමුදලි මැතිණිය සහභාගී වූහ. තරඟාවලිය සඳහා 1, 7, 2 (සෙව්) සහ 3 (සෙව්) යුද්ධ හමුදා කාන්තා බලකා නියෝජනය කරමින් කණ්ඩායම් සහභාගී වූ අතර, එහිදී 1 වන යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායම එහි ශූරතාවය දිනාගත්හ. අවසන් මහා තරඟය සියැසින් නැරඹීම සඳහා එම රෙජිමේන්තු සාමාජිකාවන් රැසක් සහභාගී වූහ.










# අන්තර් ඒකක සරඹ තරඟාවලිය හා ජය සංකේත ප්‍රදානෝත්සවය 2024



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා " අන්තර් ඒකක සරඹ තරඟාවලිය හා ජය සංකේත ප්‍රදානෝත්සවය - 2024" එම බලකා මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් රොහාන් ජයකොඩි ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමාගේ ප්‍රධානත්වයෙන් කළුඅග්ගල කාන්තා බලකා පුහුණු පාසලේදී 2024 ජුනි මස 14 වන දින පැවැත්විණි.

තරඟාවලිය සඳහා 1, 7 ශ්‍රීලයුකාබ සහ 2, 3 (සෙව්) ශ්‍රීලයුකාබ ඒකක වෙතින් සරඹ ඛණ්ඩ 04 ක් සහභාගී වූ අතර, එහිදී සමස්ත ලකුණු තුළින් වැඩි ලකුණු ප්‍රතිශතයක් ලබාගනිමින් දක්ෂතම සරඹ ඛණ්ඩය ලෙස 1 වන යුද්ධ හමුදා කාන්තා බලකා සරඹ කණ්ඩය ශූරතාවය දිනාගනු ලැබීය. එම ඛණ්ඩයට අණදුන් කපිතාන් මධූකා තෙන්නකෝන් දක්ෂතම සරඹ කණ්ඩ අණදෙන්නිය ලෙස ද, 7 වන කාන්තා බලකා ඛණ්ඩයේ මාණ්ඩලික සැරයන් ධර්මිණී එන් දක්ෂතම සරඹ උපදේශකවරිය ලෙස ද ජය සංකේත හිමිකරගනු ලැබූහ.



# හෘදයාංගම මතකයේ ගෞරවනීය බුහුමන...

තිස්වසරක් පුරා රැඳි
අනවරථ සටනෙහි
රුදුන් අබිමුව විකුම් පා
නුඹෙන් ගිලිහී වැලි පොලොවේ රැඳි
රුහිරු සළකුණු...
අනෝරා වැසි වැටුනද කිසිදා
මැකී නොයේ
උපන්බිම රැකුමට උතුම් දිවි කැපකළ
වෙහෙර මහා කුලයේ වීර දියණිවරුනි,
මේ ගෞරවනීය බුහුමන
ඔබ උදෙසාමය...

